**පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල - 2015**

---

පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 23 වගන්තිය යටතේ පනවන ලද 1986 පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් නියෝග අංක 06 සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 අරමුදලේ ක්‍රියාකාරීත්වය**

---

1985 අංක 10 දරන පළාත් පාලන සේවා (සංශෝධිත) පනතේ 14 වගන්තියට අනුව හා මුල් ප්‍රඥප්තියේ 16 (අ) (2) (1) ලෙස ඇතුළත් වගන්තිය ප්‍රකාරව උක්ත අරමුදලේ පාලනය විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු බව සඳහන්ව ඇතත් පනත සංශෝධනය කිරීමකින් තොරව 2010 දෙසැම්බර් 13 දිනැති අංක 12/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය මඟින් අරමුදලේ මාසික වැටුප් ලේඛන පිළියෙල කිරීම හා ලිපි ගොනුවල භාරකාරත්වය 2011 ජනවාරි 01 දින සිට ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත විමධ්‍යගත කර තිබුණි.

## 1.5 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 අහිතකර මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 ට පටහැනිව මුදල් පදනම මත සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුම පිළියෙල කර තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

අරමුදලට ලැබෙන සියළුම ලැබීම් හා ගෙවීම් අරමුදලේ ආදායම් හා වියදම් ප්‍රකාශය මඟින් වාර්තා කළ යුතු නමුත් මෙම අරමුදලට අදාල වන්නා වූ ගනුදෙනු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ පොදු ගිණුම හරහා සිදු කර තිබීම හේතුවෙන් විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලද රු. 92,167,536ක් හා වර්ෂයේ විශ්‍රාම වැටුප් වියදම රු. 92,167,536 ක් ගිණුම්වලින් අත් හැරී තිබුණි. කෙසේ වුවද අරමුදල විසින් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කරන ලද ආයෝජන උපලබ්ධි වීම් හා ඒ මත ලද පොළී රු.241,614,357ක් විශ්‍රාම වැටුප් ගෙවීම් ලෙස දක්වා තිබුණි. විශ්‍රාම වැටුප් ගෙවීම් සටහනක් මඟින් හෝ පෙන්නුම් නොකිරීම නිසා අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම් ගිණුම් තුළින් නිවැරදිව පිළිබිඹු වී නොතිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට විශ්‍රාමිකයින් සංඛ්‍යාව 4,850 ක් හා 2015 දෙසැම්බර් 31 දිනට 5,181 ක් බව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු පරිගණක දත්ත පද්ධතියේ තොරතුරු අනුව නිරීක්ෂණය වුවද, අරමුදලට අදාල විශ්‍රාමිකයින් සංඛ්‍යාව හඳුනාගෙන ඊට වාර්ෂිකව එකතුවීම් හෝ මියයාම් ගලපමින් අරමුදලේ විශ්‍රාමිකයින් සංඛ්‍යාව පිළිබඳව තොරතුරු අරමුදල විසින් පවත්වා නොතිබීම හේතුවෙන්, විශ්‍රාමිකයින් 331 දෙනෙකුගේ වැඩිවීම තහවුරු කර ගැනීම සඳහා වූ කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 2.3 නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ් /423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 (අ) ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනය පිළියෙල කර ඒ සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.209,924,558 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.92,076,168 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.117,848,390 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. කෙසේ වුවද 2.2.2 ඡේදයේ දක්වා ඇති ගිණුම්කරණ අඩුපාඩු මත මෙම මූල්‍ය ප්‍රතිඵලය වෙනස් වනු ඇත.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

1985 අංක 10 දරන පළාත් පාලන සේවා (සංශෝධිත) පනතේ 16 (අ) වගන්තිය ප්‍රකාරව පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත සාමාජිකයින්ගේ වැන්දඹු පුරුෂයන්ට සහ අනත්දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීමේ අරමුණින් මෙම අරමුදල පිහිටුවා තිබූ නමුත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ අයවැය ප්‍රතිපාදන මඟින් අරමුදලේ වියදම් දැරීම හේතුවෙන් මෙම අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටු වී නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

------------------------------------

### 5.1 අභ්‍යන්තර විගණනය

------------------------

සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | අරමුදලේ ක්‍රියාකාරීත්වය පිළිබිඹු වන පරිදි ආදායම් හා වියදම් ගිණුම්ගත කර නොතිබුණි. |
| (ආ) විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳ පාලනය | ප්‍රාදේශීය මට්ටමින් තොරතුරු කැඳවා අරමුදලේ සාමාජිකයන් පිළිබඳ තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබූ අතර ඒ අනුව විශ්‍රාම වැටුප් වියදම තහවුරු කරගෙන නොතිබුණි. |